## මවු සමාගමේ ඉහළ වැටුප් සියලු වරප්‍රසාද ලබන ස්ථිර සේවක පිරිසක්

# ටෙලිකොම් මැන්පවර් වර්ජනයට වාරණයක්

## ඊ.ටී.එෆ්.- ඊ.පී.එෆ්. දීමනා, වැටුප් වර්ධක සහ දරුවන්ට පාසල් පොත්

**රොෂන් තුෂාර**

ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගමේ ස්ථිර පත්වීම් ඉල්ලා ටෙලිකොම් මැන්පවර් සේවකයන් දින 25ක් ක්‍රියාත්මක කළ වැඩ වර්ජනය අත්හිටුවමින් වාරණ නියෝගයක් කොළඹ දිසා අධිකරණය ඊයේ (20) නිකුත් කෙළේය.

මැන් පවර් සේවකයින් ටෙලිකොම් සමාගමේ සේවකයින් ලෙස අනුයුක්ත කිරීමේ කිසිදු අවශ්‍යතාවක් හෝ නීතිමය ප්‍රතිපාදනයක් නැති බවත් ඔවුන් පැමිණිලිකාර මැන්පවර් සමාගමේ ස්ථිර සේවකයින් ලෙස ඉහළ වැටුප්, සේවක වරප්‍රසාද, ඊ.ටී.එෆ්., ඊ.පී.එෆ්. දීමනා, වාර්ෂිකව සියයට දහයක වැටුප් වර්ධන, දරුවන්ට පාසල් පොත් හා උපකරණ වාර්ෂිකව ලබන බවත්, වැඩවර්ජනය කඩාකප්පල්කාරී ක්‍රියාදමයක් බවට ඉදිරිපත් කළ කරුණු සලකා බැලීමෙන් පසුව කොළඹ ප්‍රධාන දිසා විනිසුරු සුජීව නිශ්ශංක මහතා එම වාරණය නිකුත් කෙළේය.

එස්.එල්.ටී. හියුමන් කැපිටල් සොලූෂන් සමාගම (මැන් පවර් ආයතනය) සමස්ත ලංකා විදුලි සංදේශ සේවක සංගමය හා එහි නියෝජිතයින් දස දෙනකුට එරෙහිව පැවරූ නඩුවක් සලකා බැලීමෙන් පසුව මෙම වාරණය නිකුත් කෙරිණි.

වාරණ නියෝගය පෙබරවාරි 3 දින දක්වා බල පැවැත්වෙන බව නියෝග කළ දිසා විනිසුරුවරයා විත්තිකරුවන්ට ලබන 7 වැනි දින අධිකරණයේ පෙනී සිටින ලෙසට නියෝග කෙළේය.

නීතිඥ සුදත් පෙරේරා, නීතිඥ සමාගමේ උපදෙස් පරිදි මැන්පවර් සමාගම වෙනුවෙන් කරුණු දැක්වූ ජනාධිපති නීතිඥ නයිජල් හැච් මහතා අධිකරණයට කරුණු දක්වමින් කියා සිටියේ සිය සේවකයින් දිගින් දිගටම වැඩ වර්ජනයේ නිරතවීම තම සමාගමේ මෙන්ම රටේ ආර්ථිකයට පිරිමැසිය නොහැකි පාඩු අත්කර දෙන බවය.

ටෙලිකොම් සමාගම හා සිය සමාගම අතර පවතින ගිවිසුම ප්‍රකාරව වර්ජකයින් ටෙලිකොම් සමාගමේ සේවකයින් ලෙස බඳවා ගැනීමට කිසිදු ප්‍රතිපාදනයක් නොමැති බවත්, සිය සමාගම සියලු සේවකයින්ට ඉහළ වැටුප් වරප්‍රසාද ලබාදී ඇති බවත් කරුණු ඉදිරිපත් කෙළේය.

විදුලි සංදේශ සේව සංගමයේ වැඩ වර්ජනය වෘත්තීය සමිති ආඥා පනතට හෝ කාර්මික ආරවුල් පනතට අදාළ වෘත්තීය සමිති ක්‍රියාදමයක් නොව කඩාකප්පල්කාරී ක්‍රියාවක් බවත් ජනාධිපති නීතිඥවරයා අධිකරණයට කරුණු ඉදිරිපත් කරමින් පැවසීය. සේවකයින් කිප දෙනකු ගෙන යන මෙම වැඩවර්ජනය හේතුවෙන් මැන්පවර් සමාගමේ ස්ථිර සේවකයින් 2640ක සේවය අහිමි වීමේ අවදානමක් හා සමාගමට රුපියල් බිලියන 1.6ක පාඩුවක් සිදුවන බවත් කරුණු ඉදිරිපත් කෙළේය.

කරුණු සලකා බැලූ ප්‍රධාන දිසා විනිසුරුවරයා විත්තිකරුවන්ට අතුරු තහනම් දැන්වීම් හා වාරණ නියෝග නිකුත් කරමින් ලබන 3 වැනි දින අධිකරණයේ කරුණු දක්වන ලෙසට දන්වා සිටියේය.

පැමිණිල්ල වෙනුවෙන් මනෝජ් බණ්ඩාර, ලක්ෂ්මන් පෙරේරා හා ගාමිණී බාලසූරිය නීතිඥ මහත්වරුද පෙනී සිටියහ.නඩුවේ වැඩිදුර විභාගය පෙබරවාරි 3 දින පැවැත්වේ.

## උතුරුමැදට සහ නැඟෙනහිරට වැසි

**බුද්ධිකා ඉමුලාන සහ ජයගහ සමූහ**

දිවයිනේ ප්‍රදේශ කිහිපයකට ඊයේ(20) සිට වැසි ලැබී ඇති බව වාර්තා වෙයි. විශේෂයෙන්ම උතුරුමැද සහ නැගෙනහිර පළාත්වලට මෙම වැසි ලැබී තිබේ.

අද සිට මේ සතිය තුළ තවත් ප්‍රදේශ ගණනාවකට වැසි ඇති විය හැකි බව කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව පවසයි.

ඒ අනුව උතුර, උතුරු මැද, නැගෙනහිර සහ ඌව පළාත්වලත් හම්බන්තොට දිස්ත්‍රික්කයෙන් වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති විය හැකි බවත් ඇතැම් විට මිලි මීටර් 75ට වැඩි තරමක තද වැසි ඇතිවිය හැකි බව කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව සඳහන් කරයි.සෙසු ප්‍රදේශවල තැනින් තැන පස්වරු 2න් පසු වැසි හෝ ගිගුරුම් සහිත වැසි අපේක්ෂිතය.

පැයට කිලෝමීටර 50 ක වේගයෙන් හමා යන සුළං මෙන්ම සබරගමුව සහ මධ්‍යම පළාත්වල උදෑසන කාලයේදී තද මීදුම් තත්ත්වයක් ඇති විය හැකි බව ද කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව ප්‍රකාශ කරයි.

## තලංගම ප්‍රේමදාසයන් රචනා කළ කෘති දෙකක් එළිදැක්වේ



ප්‍රවීණ ලේඛකයකු වන තලංගම ප්‍රේමදාස ශූරීන්ගේ 85 වැනි ජන්ම දිනය ජනවාරි මස 21 වැනි දිනට යෙදී තිබේ. එයට සමගාමීව, එතුමා රචනා කළ සින්ඩරෙල්ලා සහ වැඩට හපන්නු යන කෘති දිවිත්වය සදිසා ප්‍රකාශකයන් විසින් මුද්‍රණය කර එළිදැක්වීමට කටයුතු යොද තිබේ.



## අමෙරිකානු නාවික හමුදාවට අයත් 'හොපර්' මෙරටට පැමිණේ

ඇමරිකානු නාවික හමුදවට අයත් "හොපර්" යුද නෞකාව සුහද සංචාරයක් සඳහා පසුගියද (19) කොළඹ වරායට සේන්දු වූ අතර, ශ්‍රී ලංකා නාවික හමුදව විසින් නාවික සම්ප්‍රදානුකූලව එම නෞකාව පිළිගන්නා ලදී. නෞකාව වරායට පැමිණීමෙන් අනතුරුව එහි අණදෙන නිලධාරී කොමාන්ඩර් ජෝන් ඩී. ගෙබිනි මහතා බටහිර නාවික විධාන මූලස්ථානයේ දී විධාන ආඥාපති රියර් අද්මිරාල් ජයන්ත ද සිල්වා මහතා හමු වී සුහද කතාබහක නිරත විය. එහි දී මෙම නිල හමුව සනිටුහන් කරමින් ඔවුන් අතර සමරු තිළිණ හුවමාරුවක් ද සිදු විය. දින 4 ක නිල සංචාරයක් සඳහා පැමිණි එම නෞකාව දිවයිනේ රැඳී සිටින කාල සීමාව තුළ ශ්‍රී ලංකා නාවික හමුදව සංවිධානය කරනු ලබන වැඩසටහන් රාශියකට සහභාගී වීමට නියමිතය. ඒ අනුව පුහුණු වැඩසටහන් සහ නාවික හමුද ක්‍රීඩා කණ්ඩායම් සමග වැලිසර නාවික කඳවුරේ දී ක්‍රිකට්, බේස්බෝල්, අත්පන්දු සහ පැසිපන්දු, තරග කිහිපයකට ද එහි නැව් මූලව සහභාගී වනු

